# 2022 අප්‍රේල් මාසයට අදාලව 2022.04.21 දින පවත්වන ලද බිබිල ප්‍රාදේශීය සභාවේ මාසික සභා රැස්වීමේ වාර්තාව.

**දිනය** - 2022.04.21
**වේලාව** - පෙ.ව. 9.30
**ස්ථානය** - බිබිල ප්‍රාදේශීය සභාවේ සභා රැස්වීම් ශාලාව.
**සහභාගීත්වය -**

| | |
|---|---|
| 01. ජී.ජී.ආර්. සිල්වා මැතිතුමා | - ගරු සභාපති |
| 02. එස්.ඒ.එම්. චන්ද්‍රසේකර බණ්ඩා මැතිතුමා | - ගරු උප සභාපති |
| 03. එම්.ඒ. උබේසේන මැතිතුමා | - ගරු මන්ත්‍රී |
| 04. බී. විල්මට් සිල්වා මැතිතුමා | - ගරු මන්ත්‍රී |
| 05. කේ.එම්. කපිල විජේසූරිය මැතිතුමා | - ගරු මන්ත්‍රී |
| 06. ආර්.බී. අත්තනායක මැතිතුමා | - ගරු මන්ත්‍රී |
| 07. ඒ.එම්. නදීශා ජයමිණි ගුණසේකර මැතිතුමිය | - ගරු මන්ත්‍රිණී |
| 08. බී.එම්. ජයලත් බණ්ඩාර මැතිතුමා | - ගරු මන්ත්‍රී |
| 09. කේ.එම්.ඒ. බන්දුල ජයවර්ධන මැතිතුමා | - ගරු මන්ත්‍රී |
| 10. එල්.ඒ.බී. චන්ද්‍රිකා මල්කාන්ති මැතිතුමිය | - ගරු මන්ත්‍රිණී |
| 11. ඩී.එම්. කරුණාවතී මැතිතුමිය | - ගරු මන්ත්‍රිණී |
| 12. ජේ.ඒ. අමාලී කාංචනා ජයලත් මැතිතුමිය | - ගරු මන්ත්‍රිණී |
| 13. ඒ.එම්. තිලක් අත්තනායක මැතිතුමා | - ගරු මන්ත්‍රී |
| 14.ඩී.එම්. ශ්‍රියානන්ද දිසානායක මැතිතුමා | - ගරු මන්ත්‍රී |
| 15. එච්.එම්. සරත් කුමාර මැතිතුමා | - ගරු මන්ත්‍රී |
| 16. එම්.ජී. පුන්සඳ විජය කුමාර මැතිතුමා | - ගරු මන්ත්‍රී |

## පසුගිය මාසයේ සභා රැස්වීමේ වාර්තාව සභා සම්මත කිරීම.

2022.03.22 දින පවත්වන ලද මාසික සභා රැස්වීම් වාර්තාව ගරු මන්ත්‍රීතුමන්ලා වෙත 2022.04.12 වන දින මා විසින් යොමුකර ඇති බැවින් එම වාර්තාව මෙම සභාවේ කියවූවා සේ සලකා වාර්තාව සභා සම්මත කර ගන්නා ලෙසත් වාර්තාවේ සංශෝධන කිසිවක් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙසත් ගරු සභාපතිතුමා සභාවට දන්වන ලදී.

එහිදී ගරු මන්ත්‍රී එම්.ඒ. උබේසේන මැතිතුමා පසුගිය මස සභා වාර්තාව සභා සම්මත කිරීමේ යෝජනාව ඉදිරිපත් කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී බී. විල්මට් සිල්වා මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් 2022.03.22 දිනැති සභා වාර්තාව සභා සම්මත විය.

## 02. ගරු සභාපතිතුමා විසින් කරනු ලැබූ විශේෂ නිවේදන.

### **2.1.** 2022 මාර්තු මාසය තුල කොවිඩ් ප්‍රතිකාර මෙහෙයුම් මධ්‍යස්ථානය සම්බන්ධ වාර්තාව .

2022 මාර්තු මාසය තුල බිබිල සෞඛ්‍ය නිළධාරි කාර්යාලය හරහා RAT හෝ PCR පරීක්ෂණ හරහා කිසිදු කොවිඩ් ආසාධිත රෝගීයෙකු සම්බන්ධ වාර්තා නොලැබුණ බැවින් මාර්තු මාසය තුළ කොවිඩ් මෙහෙයුම් මධ්‍යස්ථානය හරහා ආයුර්වේද ඖෂධ ලබා දීම සිදු නොවූ නමුත් පුද්ගල ශරීරය තුළ ප්‍රතිශක්තිය ආරක්ෂා කිරීම හා වර්ධනය කිරීම අරමුණු කරගෙන මාර්තු මාසය තුලත් සුවධරණී පේයාව කි.ග්‍රෑ.1.1ක ප්‍රමාණයක් බෙදා දුන් අතර රටේ පවතින ඉන්ධන හිඟතාවය හේතුවෙන් රෝගීන්ට ප්‍රතිකාර සඳහා පැමිණීමට ප්‍රවාහන පහසුකම් ලබා ගැනීමේ දුෂ්කරතාවය

මත බිබිල ප්‍රාදේශීය සභාවේ ගරු සභාපතිතුමා ප්‍රමුඛ මන්ත්‍රීවරුන්ගේ සහයෝගය මත බිබිල බල ප්‍රදේශය තුල ගමින් ගමට විශේෂ ආයුර්වේද සායන පවත්වා ආයුර්වේද ප්‍රතිකාර ලබා ගන්නා රෝගින් හට අවශ්‍ය ප්‍රතිකාර ලබා දිම මෙම මස සිට ආරම්භ කළ බව නිවේදනය කළේය.

## 03.ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන සභාව ඉදිරියේ තැබිම.

කිසිවක් ඉදිරිපත් වී නොමැත.

## 04.යථාපරිදි කල්දී ඇති ප්‍රශ්න.

කිසිවක් ඉදිරිපත් වී නොමැත.

## 05.යථාපරිදි කල්දී ඇති යෝජනා.

### 05.01.ගරු සභාපති ජී.ජී.ආර්. සිල්වා මැතිතුමාගේ යෝජනා.

#### 05.01.01.2022 වර්ෂයට විගණන හා කළමණාකරන කමිටුව පත් කිරීම සම්බන්ධවයි.

2022 වර්ෂයට බිබිල ප්‍රාදේශීය සභාවේ විගණන හා කළමණාකරන කමිටුවක් පත්කර නොමැති බැවින් පහත නිලධාරීන් සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

කමිටුවේ සභාපති - ඒ.බී.ප්‍රසංග නලීන් කුමාර මහතා - සභා ලේකම්

සාමාජිකයින්

| | |
|---|---|
| කේ.ඕ.එච්.බී.තිලකරත්න මහතා | - ප්‍රධාන කළමණාකාර සහකාර |
| එච්.එම්. ජයරත්න මහතා | - ආදායම් පරීක්ෂක |
| ඩී.එම්.එච්.මැණිකේ මිය | - සංවර්ධන නිලධාරි |
| කේ.එච්.එම්.කාංචනා සුරංගනී මිය | - සංවර්ධන නිලධාරි |
| බී.එම්.චම්පිකා කුමාරි බටගොඩ මිය | - සංවර්ධන නිලධාරි |
| ආර්.බී.මංජුලා කෞෂල්‍යා මිය | - කළමණාකරණ සහකාර |

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී බී.එම්. ජයලත් බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සභාවේ එකඟතාව විමසිය.

එහිදී ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය ඒ සඳහා හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

#### 05.01.02.රුධිරයේ ඇති සීනි මට්ටම පරීක්ෂා කිරීම සඳහා රෝගීන්ගෙන් මුදල් අයකර ගැනීම සම්බන්ධවයි.

බිබිල ප්‍රාදේශීය සභාව විසින් පවත්වාගෙන යනු ලබන බිබිල නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාව සඳහා රුධිරයේ සීනි මට්ටම පරීක්ෂා කිරීමේ ග්ලූකොමීටර් උපකරණයක් 2022.03.24 දින පරිත්‍යාග වශයෙන් ලැබී ඇති අතර එමගින් රුධිරයේ සීනි මට්ටම පරීක්ෂා කිරිමට අවශ්‍ය ලෙන්සෙට් පැක් හා රුධිරයේ ග්ලූකෝස් පරීක්ෂා කිරීමේ පටිය සභාව මඟින් මිලදී ගෙන එම පරීක්ෂණය කර ගැනිමට අවශ්‍ය රෝගීන්ට එම පරීක්ෂණය සිදු කර දීමටත් ඒ සඳහා එක්

අයෙකුගෙන් රු.100.00ක් වැනි සුළු මුදලක් අයකර ගැනීමටත් සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි. ආදායම් වියදම් සඳහා වූ පරිපූරක ඇස්තමේන්තුවේ සාරාංශය පහත දැක්වේ.

**<u>ආදායම් හා වියදම් සාරාංශය</u>**

| ආදායම | | | වියදම | | |
|---|---|---|---|---|---|
| අතිරික්ත ආදායම | | | අතිරික්ත ආදායම සඳහා වියදම | | |
| පුනරාවර්තන ආදායම | 32,000.00 | | පුනරාවර්තන වියදම | 32,000.00 | |
| | | 32,000.00 | | | 32,000.00 |
| | | 32,000.00 | | | 32,000.00 |

**<u>පුනරාවර්තන ආදායම් හා වියදම්</u>**

| අය ශීර්ෂ | අතිරික්ත ආදායම රු. | වැය සංකේත හා වැය ශීර්ෂ | ඉදිරි මාස සඳහා පරිපූරක ඇස්තමේන්තුව රු. |
|---|---|---|---|
| 2.42.1 රුධිර සීනි පරීක්ෂාව((එක් අයෙකුගෙන් රු.100.00*10)*සති 4*මාස 08) | 32,000.00 | 203-1 රුධිර සීනි පරීක්ෂා කිරීමේ උපකරණ | 32,000.00 |
| අතිරික්ත ආදායම | **32,000.00** | එකතුව | **32,000.00** |

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී බී.එම්. ජයලත් බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරිමට මහ සභාව කාරක සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී කේ.එම්. කපිල විජේසූරිය මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී බී. විල්මට් සිල්වා මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

එහි දී රු.100.00 ක මුදලක් අය කිරීම සුදුසු බවත් එම මුදල නඩත්තු වියදම් ලෙස යොදවන බවත් මෙය ආදායම් උත්පාදන මාර්ගයක් නොව සමාජ සේවා කටයුත්තක් බවටත් සාකච්ඡා විය.

අනතුරුව කාරක සභාව නැවත මහසභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී එම්.ජී. උබේසේන මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඩී.එම්. ශ්‍රියානන්ද දිසානායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

දී රු.100.00 ක මුදලක් අය කිරීම සුදුසු බවත් එම මුදල නඩත්තු වියදම් ලෙස යොදවන බවත් මෙය ආදායම් උත්පාදන මාර්ගයක් නොව සමාජ සේවා කටයුත්තක් බවටත් තීරණය විය.

ඉන් අනතුරුව පරිපූරක අයවැය ඇස්තමේන්තු යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සභාවේ එකඟතාව විමසිය.

එහිදී අදාළ තීරණය හා යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවුයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## <u>05.01.03.සීමාව ඉක්මවා වැය වූ ඉන්ධන සඳහා සභා අරමුදලින් දැරීමට අනුමැතිය ලබා ගැනීම සම්බන්ධවයි.</u>

බිබිල ප්‍රාදේශීය සභාවේ සභාපති වරයා වශයෙන් බල ප්‍රදේශය තුල මෙන්ම ඉන් පිටත විවිධ කාරණා සඳහා නිළ රථයෙන් ගමන් කලයුතු බැවින් 2022 ජනවාරි, පෙබරවාරි, මාර්තු, යන මාසයන්හි එසේ ගමන්කල නිල ගමන් වාර වෙනුවෙන් සීමාව ඉක්මවා ඉන්ධන ලීටර් 570.375 ක් ලබා ගැනීමට සිදු වු බැවින් ඒ සඳහා වැයවු මුදල සභා අරමුදලින් ගෙවීමට අනුමැතිය ලබා දෙන ලෙස මෙම ගරු සභාවට යෝජනා කරමි.

| මාසය හා වර්ෂය | වැයවු ඉන්ධන ප්‍රමාණය ලීටර් | අනුමත ඉන්ධන ප්‍රමාණය ලීටර් | වැඩිපුර වැයවු ඉන්ධන ප්‍රමාණය ලීටර් | ඩීසල් ප්‍රමාණය වැඩිවීමට හේතු |
|---|---|---|---|---|
| 2022-ජනවාරි | 603.125 | 400 | 203.125 | 2022.01.06 – කොළඹ - පළාත් පාලන අමාත්‍යාංශය වෙත සංවර්ධන ව්‍යාපෘති වල බිල්පත් රැගෙන ඒමට යාම. සභාපති තුමා<br><br>2022.01.11,12,13 - කොළඹ-පළාත් පාලන රාජ්‍ය අමාත්‍යාංශය හා මුදල් අමාත්‍යාංශය වෙත ගොස් බිබිල ප්‍රාදේශීය සභාවට අයත් කර්මාන්ත චෙක්පත් රැගෙන ඒම. -සභාපති තුමා<br><br>2022.01.22 –කොළඹ - මුදල් අමාත්‍යාංශය වෙත ගොස් මුදල් අමාත්‍ය තුමා හමුවීම. |
| 2022 පෙබරවාරි | 553.125 | 400 | 153.125 | 2022.02.24 - කොළඹ - දේශීය ණය සංවර්ධන අරමුදල් කාර්යාලය වෙත දේශීය ණය සංවර්ධන අරමුදලේ සාකච්ඡාවට සහභාගි වීමට යාම. සභාපති තුමා<br><br>2022.02.10 - කොළඹ-පළාත් පාලන රාජ්‍ය අමාත්‍යාංශයේ රැස්වීමට සහභාගිවීම හා මුදල් අමාත්‍යාංශය වෙත ගොස් ගරු රාජ්‍ය මුදල් අමාත්‍ය තුමා හමුවීම. -සභාපති තුමා |
| 2022 මාර්තු | 641.125 | 400 | 241.125 | 2022.03.16 - කොළඹ-පළාත් සභා හා පළාත් පාලන රාජ්‍ය අමාත්‍යාංශයේ බිබිල ප්‍රාදේශීය සභාව මඟින් ක්‍රියාත්මක ගම සමඟ පිළිසඳරක් වැඩසටහනෙහි ක්‍රියාත්මක ව්‍යාපෘති වල පළාත් |

| | | | | |
|---|---|---|---|---|
| | | | | පාලන අමාත්‍යාංශයට යවන ලද බිල්පත් සඳහා ගෙවීම් සම්බන්දව හා ඉදිරි සංවර්ධන කටයුතු පිළිබඳව ගරු කෘෂිකර්ම අමාත්‍ය තුමා සමඟ සාකච්ඡාවට යාම .<br>-සභාපති තුමා<br><br>2022.03.21 – කොළඹ - මුදල් අමාත්‍යාංශය වෙත ගොස් මුදල් අමාත්‍ය තුමා හමුවීම හා පළාත් පාලන අමාත්‍යාංශයේ රැස්වීමට සහභාගි වීම. - සභාපති තුමා<br><br>2022.03.31 - කොළඹ - කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශය වෙත ගරු කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍ය තුමාගේ හරිත දැක්ම නව ගෙවතු වැඩ පිළිවෙල යටතේ සිදුවන සාකච්ඡාවට සම්බන්ධ වීම. -සභාපති තුමා |

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී බී. විල්මට් සිල්වා මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.
යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරිමට මහ සභාව කාරක සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී කේ.එම්. කපිල විජේසූරිය මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී කේ.එම්.ඒ. බන්දුල ජයවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

එහිදී කොළඹ යාම සඳහා කෙටිම මාර්ගයෙහි හැකි අයුරින් ගමන් කරන ලෙසත් අධිවේගී මාර්ගය අවම ලෙස භාවිතා කරන ලෙසත් එම්.ජී. පුන්සඳ විජය කුමාර මැතිතුමා විසින් පැවසූ අතර එච්.එම්. සරත් කුමාර මැතිතුමා විසින් ඉන්ධන ලීටර් 400 වන උපරිමය වෙනස් කර ගැනීමට අනුමැතිය ලබා ගෙන කටයුතු කර කෝටා එක වැඩි කර ගැනීමට සාකච්ඡා කිරිම සුදුසු බවත් මෙම යෝජනාවට එච්.එම්. සරත් කුමාර මැතිතුමා විරුද්ධ බවත් ප්‍රකාශ කල අතර අනෙක් මන්ත්‍රීවරුන් එකඟතාවය ලබා දෙන බවට සාකච්ඡා විය.

අනතුරුව කාරක සභාව නැවත මහසභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී එම්.ඒ. උබේසේන මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඩී.එම්. ශ්‍රියානන්ද දිසානායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

කොළඹ යාම සඳහා කෙටිම මාර්ගයෙහි හැකි අයුරින් ගමන් කරන ලෙසත් අධිවේගී මාර්ගය අවම ලෙස භාවිතා කරන ලෙසත් එම්.ජී. පුන්සඳ විජය කුමාර මැතිතුමා විසින් පැවසූ අතර එච්.එම්. සරත් කුමාර මැතිතුමා විසින් ඉන්ධන ලීටර් 400 වෙනස් කර ගැනීමට අනුමැතිය ලබා ගෙන කටයුතු කර කෝටා එක වැඩි කර ගැනීමට සාකච්ඡා කිරිම සුදුසු බවත් මෙම යෝජනාවට එච්.එම්. සරත් කුමාර මැතිතුමා විරුද්ධ බවත් ප්‍රකාශ කල අතර අනෙක් මන්ත්‍රීවරුන් එකඟතාවය ලබා දෙන බවට තීරණය කරන ලදී.

ඉන් අනතුරුව යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සභාවේ එකඟතාව විමසිය.
එහිදී අදාළ තීරණය හා යෝජනාව සඳහා මන්ත්‍රී මණ්ඩලයේ බහුතර එකඟතාවය හිමිවූයෙන් යෝජනාව බහුතරයේ කැමැත්තෙන් සභා සම්මත විය.

## **05.01.04.රාජකාරී කටයුතු සඳහා ගෙවනු ලබන ගමන් වියදම් වැඩිකර ගැනීම සම්බන්ධවයි.**

බිබිල ප්‍රාදේශිය සභාවේ ආදායම් පරීක්ෂක ලෙස සේවය කරන H.M. ජයරත්න බණ්ඩාර මහතා වෙත ක්ෂේත්‍ර රාජකාරි කටයුතු වෙනුවෙන් මසකට රු.5,500.00ක ගමන් වියදමක් ගෙවන ලදී. එම මුදල ගෙවන ලද්දේ ආදායම් පරීක්ෂකවරු දෙදෙනෙක් සේවය කරන අවස්ථාවේදීය.

එහෙත් මේ වන විට M.M. අබේරත්න මහතා විශ්‍රාම ලබා ඇති බැවින් මුළු බල ප්‍රදේශය තුලම H.M. ජයරත්න බණ්ඩාර මහතා හට තනිව ක්ෂේත්‍ර රාජකාරි කටයුතු කිරීමට සිදුව ඇති බැවින් මෙතෙක් ගෙවන ලබන රු.5,500.00ක මුදල රු.7,500.00 දක්වා වැඩි කරන ලෙස ඉල්ලීමක් කර ඇත. අදාල ඉල්ලීම සාධාරණ බැවින් කොමසාරිස්තුමාගේ උපදෙස් ලබා ගෙන එම මුදල ලබා දිම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී කේ.එම්. කපිල විජේසූරිය මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සභාවේ එකඟතාව විමසිය.

එහිදී ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය ඒ සඳහා හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.05.අධිකරණ කටයුතු සඳහා පෙනී සිටීමට බලය පැවරීම.

බිබිල ප්‍රාදේශිය සභාවේ ආදායම් පරීක්ෂක ලෙස සේවය කල M.M. අබේරත්න මහතා 2022.04.19 වන දින විශ්‍රාම ලබා ඇති බැවින් එතුමා මෙතෙක් පෙනී සිටි නඩු කටයුතු සඳහා පෙනී සිටීමට දැනට බිබිල ප්‍රාදේශිය සභාවේ ආදායම් පරීක්ෂක ලෙස සේවය කරන H.M. ජයරත්න බණ්ඩාර මහතා වෙත බලය පැවරීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී බී. විල්මට් සිල්වා මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සභාවේ එකඟතාව විමසිය.

එහිදී ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය ඒ සඳහා හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.06.ආදායම් පරීක්ෂක තනතුරෙහි රාජකාරි ආවරණය කිරීම.

බිබිල ප්‍රාදේශිය සභාවේ ආදායම් පරීක්ෂක ලෙස සේවය කල M.M. අබේරත්න මහතා 2022.04.19 වන දින විශ්‍රාම ලබා ඇති බැවින් එම පුරප්පාඩුව සඳහා H.M. ජයරත්න බණ්ඩාර මහතා යෙදවීමෙන් එතුමා කළ රාජකාරි මඟහැරීමක් සිදු වන බැවින් එතුමා කළ රාජකාරි වලින් කොටසක් (කඩකුලී/ටෙන්ඩර් කුලී අය කිරීම) සඳහා දැනට ආදේශ මුරකරුවෙක් හා තාවකාලික කුලී අය කරනු ලබන J.A.ලලිත් ප්‍රියශාන්ත මහතාට පැවරීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී බී. විල්මට් සිල්වා මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සභාවේ එකඟතාව විමසිය.

එහිදී ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය ඒ සඳහා හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.07. අංක 12 දරණ එළවළු කඩකාමරයේ අයිතිය මාරු කිරීම සම්බන්ධවයි.

බිබිල අංක 12 දරණ එළවළු කඩ කාමරය බදුගෙන සිටි බිබිල,ගල්ගේලන්ද පාර, ගෝල් අධ්‍යාපන ආයතනය ලිපිනයේ පදිංචි ආර්.එම්.කැළුම් සඳරුවන් යන අයට එළවළු කඩකාමරය පවත්වාගෙන යමා අපහසු වීම හේතුවෙන් බිබිල,අයිවෙල,මැදපිටිය, නො.59/1 ලිපිනයේ පදිංචි ඩී. ආර්. විපුල්සිරි මහතා වෙත පවරා දෙන ලෙස ඉල්ලීමක් කර ඇති අතර ඩී. ආර්. විපුල්සිරි මහතා විසින් එම කඩ කාමරය පවරා ගැනීමට කැමැත්ත ප්‍රකාශ කරමින් ලිපියකින් දන්වා ඇති අතර අදාල පැවරුම් ගාස්තු අය කර පවරා දීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී බී. විල්මට් සිල්වා මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සභාවේ එකගතාව විමසිය.

එහිදී ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය ඒ සඳහා හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.08. 2022 වර්ෂය සඳහා ප්‍රසම්පාදනය නොවූ දේපල සම්බන්ධවයි.

බිබිල ප්‍රාදේශීය සභාවට අයත් දේපල 2022 වර්ෂයට අදාලව 2022.03.30දින සිට 2022.04.19 දින දක්වා ප්‍රසම්පාදනය කැඳවන ලදී.මෙම දැන්වීම සඳහා කිසිදු ප්‍රසම්පාදන අයදුම්පත්‍රයක් ලැබී නොමැත. මෙම විස්තර අනුව මෙතෙක් ප්‍රසම්පාදන මගින් බදු ලබා දීමට නොහැකි වූ පහත සඳහන් දේපල සම්බන්ධව ඉදිරි කටයුතු සඳහා තීරණයක් ගැනීමට මෙම ගරු සභාවට යෝජනා කරමි.

| ප්‍රසම්පාදන කළ දේපල | 2022 අවම ලංසුව |
|---|---|
| එළවළු කඩකාමරයක් | 50,000.00 |
| අංක 02 කුකුළු මස් වෙළඳසැල | 237,500.00 |
| අංක 03 කුකුළු මස් වෙළඳසැල | 237,500.00 |

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී කේ.එම්.ඒ. බන්දුල ජයවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරිමට මහ සභාව කාරක සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී කේ.එම්. කපිල විජේසූරිය මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඩී.එම්. ශ්‍රියානන්ද දිසානායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

එහිදී එළවළු කඩකාමරය සඳහා ඉල්ලුම්කරුවෙකු සොයාගැනීමටත් කුකුල් මස් වෙළඳසැල් වෙනත් කටයුත්තක් සඳහා යොදාගැනීමට ඉල්ලුම්කරුවන් සිටී නම් එම ඉල්ලුම් කරුවන්ට ලබා දීමටත් මේ පිළිබඳ දැන්වීමකින් දැනුවත් කිරීමටත් සාකච්ඡා විය.

අනතුරුව කාරක සභාව නැවත මහසභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී එම්.ඒ. උබේසේන මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඩී.එම්. ශ්‍රියානන්ද දිසානායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

එළවළු කඩකාමරය සඳහා ඉල්ලුම්කරුවෙකු සොයාගැනීමටත් කුකුල් මස් වෙළඳසැල් වෙනත් කටයුත්තක් සඳහා යොදාගැනීමට ඉල්ලුම්කරුවන් සිටී නම් එම ඉල්ලුම් කරුවන්ට ලබා දීමටත් මේ පිළිබඳ දැන්වීමකින් දැනුවත් කිරීමටත් තීරණය කරන ලදී.

ඉන් අනතුරුව යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සභාවේ එකඟතාව විමසිය.

එහිදී අදාළ තීරණය හා යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**05.01.09. 2021.12.31 වර්ෂය සඳහා සිදු කළ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව ඉදිරිපත් කිරීම.**

මූල්‍ය රීති සංග්‍රහයේ 203 වගන්තියට අනුව 2021.12.31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා වන භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අදාල සමීක්ෂණ මණ්ඩලය විසින් ඉදිරිපත් කර ඇත.එම නිර්දේශයන්හි පිටපත් මේ සමඟ ඉදිරිපත් කරන අතර එහි නිර්දේශ ක්‍රියාත්මක කිරීමට අනුමැතිය ලබා දීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එම්. තිලක් අත්තනායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරිමට මහ සභාව කාරක සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී කේ.එම්. කපිල විජේසූරිය මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී එම්.ජී. පුන්සඳ විජය කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

එහිදී සභාලේකම්තුමා විසින් භාණ්ඩ සමීක්ෂණ වාර්තාවට අදාල කරුණු ඉදිරිපත් කළ අතර නිර්දේශ ක්‍රියාත්මක කිරීමට අනුමැතිය ලබා දීම සුදුසු බවට සාකච්ඡා විය.

අනතුරුව කාරක සභාව නැවත මහසභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී එම්.ජේ. උබේසේන මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඩී.එම්. ශ්‍රියානන්ද දිසානායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

එහිදී සභාලේකම්තුමා විසින් භාණ්ඩ සමීක්ෂණ වාර්තාවට අදාල කරුණු ඉදිරිපත් කළ අතර නිර්දේශ ක්‍රියාත්මක කිරීමට අනුමැතිය ලබා දීම සුදුසු බවට තීරණය කරන ලදී.

ඉන් අනතුරුව යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සභාවේ එකඟතාව විමසිය.

එහිදී අදාළ තීරණය හා යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**05.01.10. පොදු වෙළඳපලට අයත් අංක A 14 දරණ කඩකාමරය නවීකරණය කිරිම සඳහා අවසර ලබා ගැනීම සම්බන්ධවයි.**

බිබිල ,අයිවෙල, විජයසිරි නිවස ලිපිනයෙහි පදිංචි W.A.K. හේමචන්ද්‍ර මහතා තමන්ගේ වියදමින් පොදු වෙළඳපලේ අංක 14 දරණ කඩකාමරය ඉදිරිපස වීදුරු ආවරණය කර නවීකරණය කිරීමට අවසර ඉල්ලමින් ලිපියක් ඉදිරිපත් කර ඇති අතර තාක්ෂණික නිලධාරිතුමාගේ/තුමියගේ අධීක්ෂණය යටතේ කඩකාමර නවීකරණය කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී බී. විල්මට් සිල්වා මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සභාවේ එකඟතාව විමසිය.

එහිදී ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය ඒ සඳහා හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.11. කාර්යාලයට යාබද ගබඩා කාමරයක් ඉදි කිරීම සම්බන්ධවයි.

බිබිල ප්‍රාදේශීය සභාවේ වැඩ පරිපාලක ලෙස කටයුතු කරන B.M.M. මධුෂාන් ජයසේකර මහතා විසින් ප්‍රාදේශීය සභාව සතු මැෂින් හා ආයුධ තබා ගැනීමට ගබඩාවේ ඉඩ ප්‍රමාණවත් නොවන බැවින් අවශ්‍ය ප්‍රමාණයට ගබඩාවක් කාර්යාලයට යාබදව ඉදි කර දෙන ලෙස ඉල්ලීමක් කර ඇති බැවින් එය ඉදි කිරීමටත් ඒ සඳහා ඇස්තමේන්තු මුදල ලෙස රු.366,931.44 ක වැය වන බැවින් ඒ සඳහා අනුමැතිය ලබා දීමටත් සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී කේ.එම්. කපිල විජේසූරිය මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට මහ සභාව කාරක සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී කේ.එම්. කපිල විජේසූරිය මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී එම්.ජී. පුන්සඳ විජය කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

එහිදී මෙම ගබඩාව ඉදි කිරීමට වැය වන මුළු මුදල ලෙස රු.366,931.44ක් ඇස්තමේන්තු කර ඇති අතර ප්‍රාදේශීය සභාවෙන්ම සෘජු ශ්‍රමය, තහඩු ,බට ආදී ඉතිරි ද්‍රව්‍ය යොදා ඉදි කිරීමෙන් 215,000.00ක උපරිමයකට යටත්ව මෙම කාර්යය නිම කිරීමට හැකි බව සාකච්ඡා විය.

අනතුරුව කාරක සභාව නැවත මහසභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී එම්.ඒ. උබේසේන මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඩී.එම්. ශ්‍රියානන්ද දිසානායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

මෙම ගබඩාව ඉදි කිරීමට වැය වන මුළු මුදල ලෙස රු.366,931.44ක් ඇස්තමේන්තු කර ඇති අතර ප්‍රාදේශීය සභාවෙන්ම සෘජු ශ්‍රමය, තහඩු ,බට ආදී ඉතිරි ද්‍රව්‍ය යොදා ඉදි කිරීමෙන් 215,000.00ක උපරිමයකට යටත්ව මෙම කාර්යය නිම කිරීමට හැකි බවටත් ඒ සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවටත් තීරණය කරන ලදී.
ඉන් අනතුරුව යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සභාවේ එකඟතාව විමසිය.
එහිදී අදාළ තීරණය හා යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.12. අංක 13 දරණ එළවළු කඩකාමරයේ අයිතිය මාරු කිරීම සම්බන්ධවයි.

බිබිල අංක 13 දරණ එළවළු කඩ කාමරය බදුගෙන සිටි බිබිල,මල්වත්ත, උස්සාගල ලිපිනයේ පදිංචි එස්.එම්.රසික සම්පත් සිටිසේකර යන අයට එළවළු කඩකාමරය පවත්වාගෙන යමා අපහසු වීම හේතුවෙන් බිබිල,අයිවෙල,මැදපිටිය, පොල්ගහපිටියේ ගෙදර ලිපිනයේ පදිංචි කේ.ඩී.වසන්ත කුමාර මහතා වෙත පවරා දෙන ලෙස ඉල්ලීමක් කර ඇති අතර කේ.ඩී.වසන්ත කුමාර මහතා විසින් එම කඩ කාමරය පවරා ගැනීමට කැමැත්ත ප්‍රකාශ කරමින් ලිපියකින් දන්වා ඇති අතර අදාල පැවරුම් ගාස්තු අය කර පවරා දීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී බී. විල්මට් සිල්වා මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සභාවේ එකඟතාව විමසිය.

එහිදී ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය ඒ සඳහා හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.13. රතුපස්කැටිය ජල යෝජනා ක්‍රමය සඳහා වතුර පොම්පයක්, වතුර පොම්පය තබන ස්ථානයක් හා බට ලබා ගැනීම සම්බන්ධවයි.

ප්‍රාදේශීය සංවර්ධන සහයක ව්‍යාපෘතිය (LDSP) මඟින් රතුපස්කැටිය ජල යෝජනා ක්‍රමය සඳහා අවශ්‍ය වතුර පොම්පයක් , වතුර පොම්පය තබන ස්ථානයක් හා බට ලබා ගැනීමට ලක්ෂ 31 ක මුදලක් වෙන් කර ඇති නමුත් අද වන විට මෙම උපකරණවල මිළ ගණන් ඉහළ යාම නිසා එම වැඩි වන මුදල සභා අරමුදලින් දැරීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී බී. විල්මට් සිල්වා මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සභාවේ එකඟතාව විමසිය.

එහිදී ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය ඒ සඳහා හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.02. ගරු මන්ත්‍රනී ඩී.එම්. කරුණාවතී මැතිතුමිය

## 05.02.01. කාන්තා හා ළමා කමිටුවක් පිහිටුවීම සම්බන්ධවයි.

2022 වර්ෂයට බිබිල ප්‍රාදේශීය සභාවේ කාන්තා හා ළමා කමිටුවක් පත්කර නොමැති බැවින් පහත නිලධාරීන් සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

සාමාජිකයින්

01. ජී.ජී.ආර්. සිල්වා මැතිතුමා - ගරු සභාපතිතුමා
02. ඩී.එම්. කරුණාවතී මැතිතුමිය - ගරු මන්ත්‍රීණී
03. ඒ.එම්. නදීශා ජයමිණී ගුණසේකර මැතිතුමිය - ගරු මන්ත්‍රීණී
04. ජේ.ඒ. අමාලී කාංචනා ජයලත් මැතිතුමිය - ගරු මන්ත්‍රීණී
05. එල්.ඒ.බී. චන්ද්‍රිකා මල්කාන්ති මැතිතුමිය - ගරු මන්ත්‍රීණී
06. පොලිස් කාන්තා නිලධාරිනියක් - බිබිල පොලිසිය
07. කාන්තා හා ළමා නිලධාරිනියක් -බිබිල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී බී. විල්මට් සිල්වා මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සභාවේ එකඟතාව විමසිය.

එහිදී ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය ඒ සඳහා හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.02.02. 25% කාන්තා කෝටා එක සුරක්ෂිත කිරීම සම්බන්ධවයි.

වර්තමානයේ 52%ක් ඉක්මවා ඇති කාන්තා ජනගහනයෙන් 25%ක් දේශපාලනයට කාන්තාවන් අනිවාර්ය කිරිමේ කෝටා එක 10%ක් දක්වා අඩු කිරීමට කටයුතු යොදන බවට ආරංචි වී ඇති බැවින් මෙම 25% කාන්තාවන් දේශපාලනයට යොදා ගැනීමේ යෝජනාව සුරක්ෂිත කර ගැනීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී බී. විල්මට් සිල්වා මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සභාවේ එකඟතාව විමසිය.

එහිදී ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය ඒ සඳහා හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 06. කාරක සභා වල වාර්තා ඉදිරිපත් කිරිම.
## 06.01. 2022 මාර්තු මුදල් හා ප්‍රතිපත්ති කමිටුව සම්බන්ධවයි.

මුදල් හා ප්‍රතිපත්ති කමිටු වාර්තාව ඉදිරිපත් කිරිම කමිටුවේ සභාපති ගරු සභාපති ජී.ජී.ආර්. සිල්වා මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලදි.

එම වාර්තාව මඟින් ඔවුන් යෝජනා කර තිබූනේ 2022 පොදු අරමුදල් යටතේ මහියංගන මාර්ගයේ දැවනේලන්ද පාර කොන්ක්‍රීට් කිරිම ව්‍යාපෘතියේ වැඩ අවසන් බිල්පත් පියවීමට රු.344,457.67 මුදලක් කවුඩැල්ල සමගි ගොවි සංවිධානය වෙත ගෙවීමට නිර්දේශ කිරීම, 2021 පොදු අරමුදල් යටතේ යල්කුඹුර පෙර පාසලේ වැසිකිලි 02 ඉදිකිරීම ව්‍යාපෘතියේ වැඩ අවසන් බිල්පත් පියවමට රු.211,503.30 මුදලක් එකමුතු ග්‍රාම සංවර්ධන සමිතිය වෙත ගෙවීමට නිර්දේශ කිරීම, කාර්යාලය සඳහා ලබාගත් ලිපි ද්‍රව්‍ය හා සෞඛ්‍ය උපකරණ වෙනුවෙන් බිල්පත් පියවීම රු.144,576.00 මුදලක් ඉම්මියාස් පකීර්ඩීන් වෙත ගෙවීමට නිර්දේශ කිරීම, කාර්යාලය සඳහා ලබාගත් ලිපි ද්‍රව්‍ය වෙනුවෙන් බිල්පත් ගෙවීම රු.208,312.00 මුදලක් ජේපර්ලයින් ට්‍රේඩින්ග් (පුද්) සමාගම වෙත ගෙවීමට නිර්දේශ කිරීම, බිබිල ප්‍රාදේශීය සභාවට අයත් වාහන හා යන්ත්‍ර සූත්‍ර වලට යෙදීමට ලබාගත් ඉන්ධන බිල්පත් ගෙවීම රු.208312.00 මුදලක් යොමාල් ෆිලින් ස්ටේෂන් (පුද්) සමාගම වෙත ගෙවීමට නිර්දේශ කිරීම හා බිබිල බස් නැවතුම්පල භූමියේ නගරයේ ප්‍රජාවට පිරිසිදු පානීය ජලය ලබා දීමේ ව්‍යාපෘතිය සඳහා ජල පිරිපහදු ස්ථානගත කිරීමට අදාල කුටි සකස් කිරීමට ද්‍රව්‍ය ලබා ගැනීම වෙනුවෙන් රු.347,100.00 මුදලක් කඳුරට හාඩ්වෙයාර් වෙත ගෙවීමට නිර්දේශ කිරීම සුදුසු බවයි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී එම්.ඒ. උබේසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සභාවේ එකඟතාව විමසිය.

එහිදී ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය ඒ සඳහා හිමිවූයෙන් කාරක සභා වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

## 07.ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ එකතුකල ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තා සහ ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කිරීමට නියමිත වෙනත් ලේඛන ඉදිරිපත් කිරීම හා සලකා බැලිම.

2022 මාර්තු මාසයට අදාල ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ (ප්‍රා.ස. 16 හා ප්‍රා.ස. 14) සහ හිඟ ආදායම් පිළිබඳ විස්තර (ප්‍රා.ස. 07)සභාවේ දැනගැනීම හා අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදි.

<u>ආදායම්</u>

| | |
|---|---|
| පුනරාවර්තන ආදායම් | **- රු. 8,051,999.85** |
| මූලධන ලැබීම් | **- රු. -** |

| | |
|---|---|
| **ප්‍රාග්ධන ලැබීම්** | - රු. - |
| වෙනත් ලැබීම් | - රු. 1,157,020.55 |
| මුළු ලැබීම් | - රු **9,209,020.40** |

**<u>වියදම්</u>**

| | |
|---|---|
| පුනරාවර්තන වියදම් | - රු. 6,506,457.11 |
| ප්‍රාග්ධන වියදම් | - රු. 904,670.74 |
| ණය ආපසු ගෙවීම් | - රු. 642,629.08 |
| වෙනත් වියදම් | - රු. 1,345,358.35 |
| ආයෝජන | _රු. - |
| මුළු වියදම් | - රු 9,399,115.28 |

**<u>2022.03.31 දිනට තවදුරටත් හිග ආදායම් විස්තරය</u>**

| | |
|---|---|
| වරිපනම් බදු | - රු. 7,400,412.84 |
| අක්කර බදු | - රු. 5,415.68 |
| ජල ගාස්තු | - රු. 623,440.94 |
| ජල රතුපස්කැටිය ජල යෝජනා ක්‍රමය | - රු. 241,742.00 |
| කුලී මුදල් | - රු. 2,308,910.03 |
| ටෙන්ඩර් මඟින් කුලියටදීම් | - රු. 5,209,869.92 |
| එකතුව | - රු 15,789,791.41 |

ඉදිරිපත් කර ඇති ඉහත ආදායම් හා වියදම් වාර්තා ගරු මන්ත්‍රී බී. විල්මට් සිල්වා මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

අනතුරුව මෙම ආදායම් වියදම් හා හිඟ වාර්තා සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සභාවේ එකඟතාවය විමසන ලදි.
ගරු සභාවේ මන්ත්‍රී මණ්ඩලයේ සියළු දෙනාද ඊට එකඟතාවය පලකළෙන් ආදායම් වියදම් හා හිඟ ආදායම් වාර්තා ඒකමතිකව සභා සම්මත විය.

## <u>08.වෙනත් කරුණු</u>

## <u>08.01. මන්ත්‍රීවරුන් නිවාඩු බව දැන්වීම.</u>

ඒ.එම්. සුදුනිලමේ මැතිතුමා වෛද්‍ය හේතුන් මත මෙදින මාසික සභා රැස්වීම සඳහා නොපැමිණෙන බව ලිඛිතව දන්වා ඇති අතර නිවාඩු අනුමත කිරීම සුදුසු බව යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී බී. විල්මට් සිල්වා මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.
යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සභාවේ එකඟතාව විමසිය.
එහිදී ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය ඒ සඳහා හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>ගරු මන්ත්‍රී එම්.ජී. පුන්සඳ විජය කුමාර මැතිතුමා අදහස් දැක්වීම.</u>**

ගරු මන්ත්‍රී එම්.ජී. පුන්සඳ විජය කුමාර මැතිතුමා අදහස් දක්වමින් පසුගිය සති දෙකකට කලින් බිබිල සතිපොල පිටුපස කොන්ක්‍රීට් කිරීම පිළිබඳව සොයා බැලීමට කිසිදු බලධාරියෙක් නොසිටි

බවත් ඒ පිළිබඳව අධීක්ෂණ නිලධාරියෙක් යොදවන ලෙසත් රට තුළ ඇති ගැටළුවකාරී තත්තවය නිසා අද වන විට ආණ්ඩු විරෝධී රැල්ලක් නිර්මාණය වී ඇති බැවින් මෙවැනි රැලි බිබිල ප්‍රදේශයේ ද නිර්මාණය වී ඇති අතර මෙවැනි රැලි නිර්මාණය වූ අවස්ථාවේ දී එම නීති විරෝධීව එකතු වන කණ්ඩායම් මැඩ පවත්වාගෙන යාමට ගරු මන්ත්‍රී එච්.එම්. සරත් කුමාර මැතිතුමා සමඟද සාකච්ඡා කර මැඩ පැවැත්වීමට කටයුතු කළ බවත් ප්‍රාදේශීය කමිටුවක් රැස්ව බිබිල නගරයේ ඇති ගැටළුවලට විසඳුම් ලබා ගැනීම කටයුතු කිරීමට සභාපතිතුමාගේ නායකත්වයෙන් ආරම්භ කරන ලෙසත් පවසමින් සිය අදහස් දැක්වීම නිමා කරන ලදි.

**<u>ගරු මන්ත්‍රී එච්.එම්. සරත් කුමාර මැතිතුමා අදහස් දැක්වීම.</u>**

ගරු මන්ත්‍රී එච්.එම්. සරත් කුමාර මැතිතුමා අදහස් දක්වමින් පුස්තකාල 03ක් බිබිල ප්‍රදේශය තුළ පැවතියත් පාඨකයන් නිසියාකාරව පරිශීලනය කරනවාද යන්න ගැටළුවක් ඇති අතර ඒ පිළිබඳ අවධානය යොමු කළ යුතු බවත් නාගල පුස්තකාලය ප්‍රාදේශීය සභා පාලනය යටතේ ඇතිමුත් ප්‍රමාණවත් පාඨකයන් පිරිසක් එයින් ප්‍රයෝජනය නොගන්නා බවත් එයින් අපේ උත්සහයේ ප්‍රතිඵලයක් නොමැති වන බවත් අදහසක් ලෙස විෂයභාර නිලධාරී හරහා පසුගිය මා 06 ඇතුළත පුස්තකාල පහසුකම් ලබා ගෙන ඇති ආකාරය පිළිබඳ සමීක්ෂණයක් කර එම ප්‍රදේශයේ දරුවන් මෙය නිවැරදිව භාවිතා නොකරන්නේ නම් ඔවුන්ව දැනුවත් කිරීම සුදුසු බවත් ආණ්ඩුවට නීති විරෝධී කණ්ඩායම් නිර්මාණය වන අතර ප්‍රචණ්ඩකාරී ක්‍රියා සිදුවන සෑම අවස්ථාවකම තමා සිටින බවත් ලෝකය ඉදිරියේ අපේ රට පරාජිත රටක් බවට පත් වී ඇති බවත් දරුවන්ට හොඳ රටක් නිර්මාණය කිරීමට සියළු දෙනා අත්වැල් බැදගමු යන්න යෝජනා කරමින් සිය අදහස් දැක්වීම නිමා කරන ලදි.

**<u>ගරු මන්ත්‍රී කේ.එම්.ඒ. බන්දුල ජයවර්ධන මැතිතුමා අදහස් දැක්වීම.</u>**

ගරු මන්ත්‍රී කේ.එම්.ඒ. බන්දුල ජයවර්ධන මැතිතුමා අදහස් දක්වමින් රටේ ඇති වී ඇති තත්ත්වය පිළිබඳ එම්.ජී. පුන්සඳ විජය කුමාර මැතිතුමා හා එච්.එම්. සරත් කුමාර මැතිතුමා අදහස් දැක්වූ අතර එ.ජා.ප. අද වන විට ප්‍රබෝදමත් ගතියක් පෙන්වන අතර අද රටේ ජනතාව උසිගන්වන ක්‍රමයෙන් බැහැර වී සිටින අතර බිබිල ප්‍රදේශයේ ඉන්ධන බෙදාහැරීමේ විෂමතාව නිසා ඇති වීමට ගිය බස් වැඩ වර්ජනය ද නතර කිරීමට හැකි වූ බවත් පෙරට වඩා අඩුවෙන් ඉන්ධනහල් සඳහා ඉන්ධන ලැබෙන බවත් මහාමාර්ග අවහිර කර ජනතාව පීඩාවට පත් කිරීම සුදුසු නොවන බව පැවසීම පිළිබඳ ස්තුතිය ප්‍රකාශ කරන බවත් සියළු ඇමතිවරු මේ ආණ්ඩුවට සම්බන්ධව කටයුතු කර ඇති අතර පක්ෂ විපක්ෂ දෙපාර්ශවයේ මන්ත්‍රීවරු කිසිවෙක් කිසිම පරිත්‍යාගයක් කිරීමට කතා කර නොමැති බවත් වැටුපෙන් අඩක් ගෙවීමටවත් කිසිවෙක් ඉදිරිපත් නොවී ඇති අතර ලබන මාසයේ පැහැදිලි වැඩපිළිවෙලක් ලෙස තමාගේ වැටුපෙන් රු.5,000.00ක මුදලක් ලබා දීමට කැමති බවත් ඉදිරියේ සාමකාමී සමෘද්ධිමත් රටක් බිහි කිරීමට ශක්තිය ධෛර්‍යය ලැබේවා යන්න ප්‍රකාශ සිය අදහස් දැක්වීම නිමා කරන ලදි.

**<u>ගරු සභාපති ජී.ජී.ආර්. සිල්වා මැතිතුමා</u>**

ගරු සභාපති ජී.ජී.ආර්. සිල්වා මැතිතුමා පිළිතුරු කථාව කරමින් ගරු මන්ත්‍රී එම්.ජී. පුන්සඳ විජය කුමාර මැතිතුමා විසින් පවසන ලද කාරණය හොඳ කාලෝචිත කථාවක් බන බවත් බොර දියේ මාළු බාන පුද්ගලයින් කතා කරනුයේ වැදගත් නොවන දේවල් බවත් ඕනෑම පක්ෂයක් චෞරකම් කලා නම් නීත්‍යානුකූලව එවැනි දේවල් ඔප්පු කර අයකර ගැනීමට කටයුතු කළයුතු බවත් තරුණ තරුණියන් නීතියේ දිග පළල නොදැන කටයුතු කිරීම නිසා ඔවුන්ගේ අනාගතය විනාශ වන බැවින් ඔවුන්ව නිවැරදි මාර්ගයට ගැනීමට කටයුතු කරන ලෙසත් මහාමාර්ග අවහිර කිරීමෙන් පීඩාවට පත්වන්නේ අපේම ජනතාව බවත් පීඩාවට පත් කළ යුත්තේ අකටයුතුකම් කළ අයව බවත් නීතිවිරෝධීව ඇති වූ රැලි මැඩ පැවැත්වීමට කටයුතු කිරීම පිළිබඳ ස්තුතිවන්ත වන

බවත් තරුණ තරුණියන් නීතියේ දිග පළල නොදැන කටයුතු කිරීම නිසා ඔවුන්ගේ අනාගතය විනාශ වන බැවින් ඔවුන්ව නිවැරදි මාර්ගයට ගැනීමට කටයුතු කරන ලෙසත් මහාමාර්ග අවහිර කිරීමෙන් පීඩාවට පත්වන්නේ අපේම ජනතාව බවත් පීඩාවට පත් කළ යුත්තේ අකටයුතුකම් කළ අයව බවත් නීතිවිරෝධීව ඇති වූ රැලි මැඩ පැවැත්වීමට කටයුතු කිරීම පිළිබඳ ස්තූතිවන්ත වන බවත් සතිපොලේ පිටුපස කොන්ක්‍රීට් හා කම්බි බඳින අවස්ථාවේ දී කාර්මික නිලධාරිතුමිය දැනුවත් කර අධීක්ෂණය කිරීමට යොදවන බවත් පැවසීය.
එච්.එම්. සරත් කුමාර මැතිතුමා විසින් පෙර සභා වාරයේ දී ප්‍රකාශ කළ බිබිල බාලිකාව අසල ක්‍රීඩාංගනය පවරා ගැනීමට පෙර අලුත්වැඩියාවට අරමුදල් වෙන් කර ගැනීම නීතිමය ගැටළුවක් ඇති බව ප්‍රකාශ කළ අතර ඉන් අනතුරුව ප්‍රාදේශීය ලේකම්තුමිය වාර්තා හා ස්ථාන පරීක්ෂාවට කතා කළ බවත් වොලිබෝල් තරඟාවලිය 2022.04.17 වන දින පැවැත් වූ බවත් මේ අවස්ථාව නොසුදුසු වුවත් වසරකට පෙර වොලිබෝල් හා නෙට් ලබා ගැනීම නිසා මේ වසරේ පැවැත්වූ බවත් ඒ සඳහා කණ්ඩායම් 18ක් සහභාගි වූ බවත් පුස්තකාලවල පාඨකයන්ගේ ගැටළුවක් ඇති බවත් මාසෙන් මාස වාර්තාවක් ලබා ගැනීමට කටයුතු කරන ලෙසත් පාඨක සමාජය හා දායක සමාජය කැඳවා දැනුවත් කර සාකච්ඡා කිරීමටත් ඒ සඳහා කමිටුවක් පත් කරන ලෙස සභාපතිතුමා විසින් ලේකම්තුමාට පැවසූ අතර කේ.එම්.ඒ. බන්දුල ජයවර්ධන මැතිතුමා ප්‍රකාශ කළ ආකාරයට පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන් ඔවුන්ගේ පටි තද කර ගැනීමට කටයුතු කරන බවත් අනෙක් අයට ආදර්ශමත් වන ආකාරයෙන් කටයුතු කළා නම් එය සුදුසු බවත් අපි ඒ කැපවීම කිරීමට කැමති බවත් ආරම්භයේදී දීමනාවක්වත් නොලබා සමාජයට සේවය කරන පිරිසක් සිටි අතර අද පාර්ලිමේන්තුවට ගිය මන්ත්‍රීවරුන්ගේ දේපල එන විට ඊටත් වඩා වැඩි අතර ඒවා විගණනය කර අය කර ගැනීමට අවශ්‍ය දේවල් අය කර ගත යුතු බවත් ජනතාවට වැඩ කරන, ජනතාව ගැන සිතන පිරිසක් බිහිවිය යුතු බවත් අධ්‍යාපන මට්ටම හා හැකියාවලින් පිරි පිරිසක් පාර්ලමේන්තුවට තෝරා ගැනීමට කටයුතු කළ යුතු බවත් ඇතැම් ඇමතිවරු ඉහළ අධ්‍යාපන මට්ටමක් ඇතිමුත් තීරණ ගනු ලබන්නේ පොඩි ළමයින්ගේ තීරණ ලෙස බවත් මහා භාණ්ඩාගාරයට අපෙන් දායකත්වය ලබා දීමට හැකිනම් එසේ කිරීමට කටයුතු සිදු කරමු යන්න ප්‍රකාශ කරමින් සිය පිළිතුරු කථාව නිමා කරන ලදි.

මීළඟ මාසික සභාව 2022 මැයි මස 24 වන අඟහරුවාදා පෙරවරු 9.30ට ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදි පැවැත් වීමට තීරණය කරමින් සභාවේ වැඩකටයුතු අවසන් කරන ලදි.

ජී.ජී.ආර්. සිල්වා,
සභාපති,
බිබිල ප්‍රාදේශීය සභාව.

ජී.ජී.ආර් සිල්වා
සභාපති
බිබිල ප්‍රාදේශීය සභාව
බිබිල

පිටපත්
01. ඌව පළාතේ පළාත් පාලන කොමසාරිස්, බදුල්ල. - කා.දැ.ගැ.පි.
02. පළාත් පාලන සහකාර කොමසාරිස්, මොණරාගල. - කා.දැ.ගැ.පි.
03.විගණන අධිකාරි, ජාතික විගණන උප කාර්යාලය, හුලංදාව,මොණරාගල- කා.දැ.ගැ.පි.